# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 318 / 2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திக / Date — 22/02/2024 පැය 0700

## මාධ්‍ය නිවේදනය

**"යුක්තිය" මෙහෙයුමට සමගාමීව ක්‍රියාත්මක වන ඖෂධ අළෙවිසැල් වැටලීමේ මෙහෙයුම - බස්නාහිර පළාත.**

"යුක්තිය" මෙහෙයුම මගින් මත්ද්‍රව්‍ය වැටලීම් දිගින් දිගටම සිදු කිරීමත් සමග විවිධ රෝගාබාධවලට ලබාදෙන ඖෂධ අධි මාත්‍රාවන්, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයින් විසින් භාවිතා කිරීම හා ඇතැම් ඖෂධ අළෙවිසැල් මගින් එම ඖෂධ වර්ග වෛද්‍ය නිර්දේශයකින් තොරව එම පුද්ගලයින්ට අධික මිලට අලෙවි කරන බවට තොරතුරු ලැබී තිබුණි.

ඒ අනුව පොලිසිය විසින් යුක්තිය මෙහෙයුමට අදාලව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිලධාරීන් හට අවශ්‍ය සහාය ලබා දෙමින් 2024.02.20 හා 21 වන දෙදින තුල බස්නාහිර පළාතේ පොලිස් වසම් වල හඳුනාගත් ප්‍රදේශවල පිහිටි තෝරාගත් ඖෂධ අළෙවිසැල් සම්බන්ධව වැටලීම් සිදුකර **ඖෂධ වට්ටෝරු රහිතව මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයින් හට නීති විරෝධී ලෙස අධික මිළ ගණන් වලට ඖෂධ අළෙවි කිරීම සම්බන්ධයෙන් සැකකරුවන් 04 දෙනෙකු හා සැකකාරියන් 04 දෙනෙකු ඖෂධ නියාමන අධිකාරියේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත. එහිදී එම ඖෂධ අළෙවිසැල් තුල තිබී විවිධ වර්ගයේ මත්පෙති 10,287 ක්** විමර්ශන නිලධාරීන් භාරයට ගෙන ඇත

**මෙම වැටලීම් වලට අදාල විස්තර පහත පරිදි වේ.**

කළුතර කොට්ඨාසය :-

කළුතර දකුණ පොලිස් වසමේ කළුතර නගරයේ පිහිටි ඖෂධ අළෙවිසැලක් වටලා වෛද්‍ය වට්ටෝරුව නොමැතිව ඖෂධ විකිණීම, ඖෂධ නියමන අධිකාරිය මගින් නිකුත් කල අවසර බලපත්‍රයක් නොමැතිව ඖෂධ නිකුත් කිරීම යන චෝදනාව යටතේ අවුරුදු 24 වයසේ පසුවන කළුතර උතුර හා දර්ගා නගරය ප්‍රදේශවල පදිංචි සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

නුගේගොඩ කොට්ඨාසය :-

හෝමාගම පොලිස් වසමේ පිටිපන දකුණ ප්‍රදේශයේ හා මහරගම පොලිස් වසමේ පන්නිපිටිය ප්‍රදේශයේ පිහිටි ඖෂධ අළෙවිසැල් 02 ක් වටලා වෛද්‍ය නිර්දේශයකින් තොරව ඖෂධ මුදලට විකිණීම සම්බන්ධයෙන් අවුරුදු 47 හා 70 වයස්වල පසුවන කිරිඇල්ල හා පන්නිපිටිය ප්‍රදේශවල පදිංචි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

මීගමුව කොට්ඨාසය :-

මීගමුව පොලිස් වසමේ පිහිටි ඖෂධ අළෙවිසැල් 02 ක් වටලා ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ලියාපදිංචි නොකරන ලද ඖෂධ සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් අවුරුදු 42 හා 45 වයස්වල පසුවන දළුපත හා මීගමුව ප්‍රදේශවල පදිංචි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

ගල්කිස්ස කොට්ඨාසය :-

ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේ පිහිටි ඖෂධ අළෙවිසැලක් වටලා ඖෂධ වට්ටෝරු රහිතව නීති විරෝධි ඖෂධ අලෙවි කිරීම හා බලපත්‍ර නොමැතිව ඖෂධ අළෙවිසැල් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වයස අවුරුදු 41 ක්වූ අත්තිඩිය ප්‍රදේශයේ පදිංචි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

ගම්පහ කොට්ඨාසය :-

මිනුවන්ගොඩ පොලිස් වසමේ මිනුවන්ගොඩ ප්‍රදේශයේ පිහිටි ඖෂධ අළෙවිසැලක් වටලා ඖෂධ වට්ටෝරු රහිතව නීති විරෝධි ඖෂධ අලෙවි කිරීම සම්බන්ධයෙන් වයස අවුරුදු 41 ක්වූ හොරම්පැල්ල ප්‍රදේශයේ පදිංචි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන්ට හා සැකකාරියන්ට ඇප ලබාදීමට කටයුතු කර ඇති අතර ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ ප්‍රතිපාදන අනුව ඔවුනට එරෙහිව නීති මඟින් කටයුතු කරනු ලබයි. **තවද මෙම ආකාරයට ඖෂධ වට්ටෝරු රහිතව නීති විරෝධී ලෙස මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන්ට විවිධ ඖෂධ වර්ග අළෙවි කරන ඖෂධ අළෙවිසැල් සම්බන්ධයෙන් යුක්තිය මෙහෙයුමට සමගාමීව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිලධාරීන් හා එක්ව ඉදිරියේදී දිවයින පුරා වැටලීම් සිදු කිරීමට සැළසුම් කර ඇත.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**